සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நிலை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

ගිණුම්කරණය - I Accounting - I	33 S I	කාලය පැය දෙකයි 02 hours

උපදෙස්

- අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

1. ගිණුම්කරණයේ මූලික අරමුණ වූ තීරණ ගැනීම සඳහා තොරතුරු සැපයීම පහත කුමන පාර්ශව වෙනුවෙන් සිදු කරන්නක් ද යන්න නිවැරදිව සඳහන් වන ප්‍රකාශ වන්නේ ?

   A. බදු අයකරන රජයේ පාර්ශව සඳහා

   B. ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණය කරන්නන් සඳහා

   C. ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශව සඳහා

   (1) A හා B පාර්ශව සඳහා (2) B හා C පාර්ශව සඳහා (3) C හා D පාර්ශව සඳහා

   (4) A හා C පාර්ශව සඳහ (5) A . B හා C පාර්ශව සඳහා

   (..............)

2. චාමරගේ ව්‍යාපාරයේ විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත යැවූ භාණ්ඩ වල වටිනාකම රු.280, 000 ක් වූ අතර මින් රු.80 ,000ක තොග 2018/03/31 වන තෙක් නොවිකිණී තිබුණි. මෙහි විකුණුම් මිල ලකුණු කර තිබුණේ පිරිවැයට 25% ලාභ ආන්තිකයක් සහිතවයි. 2018/03/31 දිනට ඉතිරි තොගය කොපමණද .

   1) 64000 2) 16000 3) 80000 4) 96000 5) 66 000 (..............)

3. සංකලනයේ වෙළඳ ව්‍යාපාරයේ 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු දී ඇත. (රු.000 වලින්)
   2018/03/31 දිනට ශුද්ධ වත්කම් රු. 5375.
   2017/03/31 දිනට ශුද්ධ වත්කම් රු. 3250.
   වර්ෂය තුළ උපයා ඇති ලාභය රු. 2700කි.
   වසර අග ශුද්ධ වත්කම් ගණනය කිරීමේ දී ලැබිය යුතු රක්ෂණ වන්දි රු. 80000ක් සැලකිල්ලට ගෙන නැත. ඒ අනුව සංකලන විසින් සිදුකල ගැනිලි කොපමණද?

   (1) 325 (2) 245 (3) 575 (4) 655 (5) 495 (..............)

4. විකිණීම හෝ ආපසු එවීමේ පදනම මත විකුණන ලද තොග ගණුදෙනුකරුට බෙදාහරින අවස්ථාවේදීම ආදායමක් ඉපදූ ලෙස හඳුනාගනු ලබන්නේ කුමන ගිණුම්කරණ සංකල්පයට අනුවද?

(1) ගැලපුම් සංකල්පය (2) උපලබ්ධි සංකල්පය (3) ආරක්ෂණ සංකල්පය

(4) අනාවරණ සංකල්පය (5) උපචිත සංකල්පය [..............]

5. දල්පතාදුගේ ව්‍යාපාරයට ණයගැතියකුගෙන් ලැබීමට තිබූ රු. 100 000 ක් වෙනුවෙන් රු. 10 000 ක වට්ටමකට යටත්ව චෙක්පතක් ලැබුණි. පසුව බැංකුව විසින් මෙම චෙක්පත අගරු වූ බව දැනුම්දෙන ලදි නම්, ණයගැති පාලන ගිණුමේ ශේෂයට කරන බලපෑම වනුයේ.

(1) 90 000 වැඩිවේ (2) 90 000 අඩුවේ (3) 100 000 වැඩිවේ

(4) 100 000 අඩුවේ (5) 110 0000 වැඩිවේ (..............)

❖ ප්‍රශ්ණ අංක 06, 07, 08 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

දහනායකගේ ව්‍යාපාරයේ ගණුදෙනු පහත දක්වේ.

2018/03/05 රු. 200 ,000 මිලට වූ තොගයක් රු. 180 000 ට විසිතුරුට ණයට විකුණන ලදී.

2018/03/10 රු. 75 ,000 තොගයක් ණයට මිලදී ගන්නා ලදී.

2018/03/18 විවිධ ආදායම් ලැබුණා. රු. 8,000කි.

2018/03/25 විසිතුරුගෙන් රු. 75.000ක චෙක්පතක් ලැබුණා.

2018/03/29 විසිතුරු රු. 30,000ක් වටිනා තොග ආපසු එවා ඇත.

6. ඉහත ගණුදෙනුවල බලපෑම් වලට පසු මුදල් පාලන ගිණුමෙහි හා ණයගැති පාලන ගිණුමෙහි ශේෂ වල වෙනස්වීම වනුයේ, (වැඩිවීම)

	මුදල් පාලන ගිණුම (රු)	ණයගැති පාලන ගිණුම (රු)
1)	158 000	180 000
2)	83 000	80 000
3)	75 000	75 000
4)	83 000	110 000
5)	83 000	75 000

(..................)

7.එම ගණුදෙනු වාර්තාකරණ මූලික සටහන් පොත් අනුපිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය වන්නේ.

1) ගැණුම් ජර්නලය, ලැබීම් ජර්නලය, ගෙවීම් ජර්නලය , ලැබීම් ජර්නලය , ආපසු යැවුම් ජර්නලය
2) විකුණුම් ජර්නලය, ගෙවීම් ජර්නලය, ලැබීම් ජර්නලය , ලැබීම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය
3) විකුණුම් ජර්නලය, ලැබීම් ජර්නලය, ලැබීම් ජර්නලය, ලැබීම් ජර්නලය , ආපසු යැවුම් ජර්නලය
4) විකුණුම් ජර්නලය, ගෙවීම් ජර්නලය, ලැබීම් ජර්නලය, ලැබීම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය
5) ගැණුම් ජර්නලය, ගෙවීම් ජර්නලය, ලැබීම් ජර්නලය, ලැබීම් ජර්නලය, ආපසු එවුම් ජර්නලය (..............)

8.ඉහත ගනුදෙනු පදනම් වන මූලාශ්‍ර ලේඛණ අනුපිළිවෙලින් දැක්වෙන නිවැරදි ප්‍රකාශය වන්නේ,

1) ඉන්වොයිසිය, වවුචරය, ලදුපත, හරපත, බැරපත
2) වවුචරය, ඉන්වොයිසිය, ලදුපත, ලදුපත, බැරපත
3) වවුචරය, ඉන්වොයිසිය, ලදුපත, හරපත, බැරපත
4) ඉන්වොයිසිය, වවුචරය, ලදුපත, ලදුපත, හරපත
5) විකුණුම් ඉන්වොයිසිය, ගැනුම් ඉන්වොයිසිය, ලදුපත, ලදුපත, බැරපත (...............)

9.ව්‍යාපාරික ගිණුම්කරණ ප්‍රත්පත්ති වලට අනුකූලව පහත කුමන ප්‍රකාශය සත්‍යවේද?

A. ආරක්ෂණ සංකල්පයට අනුව වත්කම් වල ප්‍රත්‍යාගණන අගයන් ගිණුම්වල වාර්තා කල යුතුය.
B. මුල්‍ය ගිණුම්කරණ තොරතුරු, බාහිර පාර්ශව වෙත පමණක් තොරතුරු සපයයි.
C. මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ණයගැතියන් හා ණයහිමියන් හදුනාගනු ලබන්නේ උපචිත සංකල්පයට අනුවය.
D. ව්‍යාපාරයක් ලාභ ලැබීම තුලින් වත්කම් ඉහළ යන අතර ශුද්ධ වත්කම් ද ඉහළ යයි.

(1) A හා B පමණ (2) B හා C පමණි (3) B හා D පමණි (4) C හා D පමණි (5) A හා C පමණි

(...............)

10. පහත දැක්වෙන කුමන දෑ සමාගමක මුළු හිමිකම් වෙනස් වීම සඳහා බලපානු ලබයිද?

P) උපචිත විගණන ගාස්තු පටහන් නොවීම.
Q) සංචිත ප්‍රාග්ධනීක කිරීම.
R) හිමිකම් නිකුතුවක් සිදුකිරීම.
S)කොටස් හිමියන්ට ලාභාංශයක් ගෙවීමට තීරණය කිරීම.

1) P හා Q පමණි 2) P හා R පමණි 3) P හා R පමණි 4) M , RහාS පමණි 5) Q, R හා S පමණි

(...............)

ප්‍රශ්ණ අංක 11 ,12, 13 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.

❖ දිළෙන තරු ක්‍රීඩා සමාජයට අදාල තොරතුරු කිහිපයක් පහත දක්වා ඇත.

	2017/04/01	2018/03/31
සමුච්චිත අරමුදල	540 000	?
හිඟ සාමාජික මුදල්	20 000	30 000
කලින් ලද සාමාජික මුදල්	40 000	20 000

අතිරේක තොරතුරු

1) සංගමයේ මුළු වියදම රු. 416 000කි.
2) සාමාජික සංඛ්‍යාව 800 කි. එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 1000කි.

11. 2018/03/31 දිනෙන් අවසන් වර්ෂයට ලද සාමාජික මුදල් වටිනාකම.

1) රු. 800 000කි. 2) රු. 870 000 කි. 3) රු.830 000කි 4) රු. 770 000කි. 5) රු.840 000කි

(...............)

12. 2018/03/31 දින පසුවච්ච අරමුදල් ශේෂය විය යුත්තේ,

1) රු. 428 000කි. 2) රු. 402 000කි. 3) රු.942 000කි. 4) රු. 800 000කි. 5) රු. 924 000කි.

(...............)

13. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුලත් පිළිතුරු වන්නේ,

A. ණයගැති ලෙජරයේ සිදු වූ වරදක් නිවැරදි කිරීම ණයගැති පාලන ගිණුමේද වාර්තා කරයි.

B. අත්පිට විකුණුම් රු. 50 000ක් මුදල් පාලන ගිණුම හර කිරීම වෙනුවට, ණයගැති පාලන ගිණුමට හර කිරීමේ වරද නිසා අවිනිශ්චිත ගිණුමක් පැනනගී.

C. අඩමාන ණය වෙන් කිරීමේ (ලැබිය යුතු දෑ සඳහා ගණිකරණය සඳහා අඩුකිරීම) ගිණුමේ ශේෂයක් පවතින විට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ණයගැති ශේෂය වාර්තා කිරීමේ දී, එම ශේෂය අඩුකර පෙන්විය යුතුය.

D. ණයහිමි ලෙජරයේ "ගැණුම් " එවීතාකම අඩුවෙන් වාර්තා වී ඇති විටක එම වෙනස අවිනිශ්චිත ගිණුමක වාර්තා නොකල යුතුය.

(1) A හා B පමණි (2) B හා C පමණි (3) A හා D පමණි (4) B හා D පමණි (5) C හා D පමණි

(...............)

ප්‍රශ්න අංක 14 ,15, 16 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

❖ සුරත්, ජනිත්, මලිත් හවුල් ව්‍යාපාරයේ 2018/03/31 දිනට ප්‍රාග්ධන ගිණුමේ සහ ජංගම ගිණුම් වල පහත ශේෂයන් දක්නට ලැබුණි.

	සුරත්	ජනිත්	මලිත්
ප්‍රාග්ධන ගිණුම	1000,000	800 ,000	600 ,000
ජංගම ගිණුම	200 ,000	100 ,000	(40 ,000)

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී පහත සදහන් කරුණු නොසලකා හැර ඇත.

1) 2017/04/01 මලිත් හවුල් ව්‍යාපාරයට බැඳුණු අතර, එදිනට කීර්තිනාමය රු. 1200 ,000කි.

2) මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී අවසන් තොග එවීතාකම රු. 600 ,000ට අඩුවෙන් වාර්තා වී ඇත.

3) හවුල්කරුවන්ගේ ගැනිලි සුරත් රු. 60 000 , ජනිත් රු. 40 000 සහ මලිත් රු. 30 000කි.

4) ස්ථාවර තැන්පතු පොලිය රු. රු. 60 000ක් ලැබිය යුතුව තිබුණි.

5) මලිත් හවුල්කරුවකු ලෙස බැඳීමට පෙර ලාභ අලාභ සමානව බෙදා ගන්නා ලදි. ඉන් පසු එය 5 : 3 : 2 කි. ඉහත තොරතුරු පදනම් කර ගනිමින්,

14. ඉහත සංශෝධනයන් කළ පසු විසර්ජනය කළ හැකි ලාභය වන්නේ ,

1) රු. 600,00කි. 2) රු. 450,000කි. 3) රු. 540.000කි. 4)රු. 660,000කි. 5)රු.560,000කි. (...............)

15. 2018/03/31දිනට හවුල් කරුවන්ගේ ජංගම ගිණුම් වල ශේෂ එකතුව විය යුත්තේ .

1) රු. 930 000කි. 2)රු. 790 000කි. 3) 970 000කි .

4) රු. 530 000කි. 5)රු. 660 000කි. (...............)

16. 2018/03/31 දිනට හවුල් ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් වශයෙන් හඳුනාගත යුතු වටිනාකම,

1) රු. 3060 000කි. 2) රු. 3600 000කි. 3) රු. 3690 000කි. 4) රු. 3910 000කි. 5) රු. 3190 000කි.

(...............)

❖ ප්‍රශ්න අංක 17, 18, 19 සඳහා පහත තොරතුරු පදනම් කර ගන්න.

සී/ස නිලගිරි සමාගම VAT සඳහා ලියාපදිංචි සමාගමකි. මෙම සමාගමේ ප්‍රධාන ගැණුම්කරුවෙකු වූ සී/ස ආරියවංශ සහ සමාගම නිශ්පාදන කටයුතු වල නියුක්ත වී ඇත. (VAT සඳහා ලියාපදිංචි වී නැත) 2018/03/01 දින ලකුණු කළ මිල රු. 1200 000 අමුද්‍රව්‍ය තොගයක් 10% වට්ටමකට යටත්ව සී/ස ආරියවංශ සමාගමට විකුණන ලදි. (VATඅනුපාතය15% කි.)

17. සී/ස නිලගිරි සමාගමේ පොත් වල මෙම ගණුදෙනුව වාර්තා කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

	හර	බැර
1)	ණයගැති පාලන ගිණුම හර රු. 1080 000	විකුණුම් ගිණුම බැර රු. 1080 000
2)	සී/ස නිලගිරි සමාගම හර රු. 1242 000	විකුණුම් ගිණුම බැර රු. 1242 000
3)	ණයගැති පාලක ගිණුම හර රු. 1080 000 VAT පාලන ගිණුම හර රු. 162 000	විකුණුම් ගිණුම බැර රු. 1242 000
4)	ණයගැති පාලන ගිණුම හර රු. 1242 000	VAT පාලන ගිණුම බැර රු. 162 000 විකුණුම් ගිණුම බැර රු. 1080 000
5)	ණයගැති පාලන ගිණුම හර රු. 1242 000	විකුණුම් ගිණුම බැර රු. 1242 000

(...............)

18. සී/ස ආරියවංශ සහ සමාගමේ පොත්වල හඳුනාගත යුතු ගැණුම් වටිනාකම විය යුත්තේ,

1) රු. 1080,000කි. 2) රු.1320,000කි. 3) රු.1230,000කි. 4) රු.1422,000කි. 5) රු.1242,000කි.

(...............)

19. 2018/03/10 දින අයවිය යුතු මුදලින් 50%ක කොටසක් අපකර ගැනීමේ දී 10%ක මුදල් වට්ටමක් ලබාදුනි. සී/ස ආරියවංශ සමාගමේ පොත්වල මෙම ගණුදෙනු වාර්තා කළ පසු අදාල වටිනාකම් පිළිවෙලින්.

1) ණයහිමි පාලන ගිණුම රු.621000 සහ ලද වට්ටම රු.62 100 විය යුතුය.

2) ණයගැති පාලන ගිණුම රු. 621 000 සහ දුන් වට්ටම රු.62 100 විය යුතුය.

3) ණයහිමි පාලන ගිණුම රු.540 000 සහ ලද වට්ටම රු.540 000 විය යුතුය.

4) ණයගැති පාලන ගිණුම රු.540 000 සහ දුන් වට්ටම රු. 54 000 විය යුතුය.

5) සී/ස නිලගිරි සමාගම රු. 540 000 සහ ලද වට්ටම රු. 54 000 විය යුතුය.

(.................)

ප්‍රශ්න අංක 20, 21 සඳහා පහත තොරතුරු පදනම් කර ගන්න.

❖ සී/ස නයගරා සමාගම 2018/03/01 දින රු.1900 000 ගොඩනැගිල්ලක් අත්පත් කර ගන්නා ලදි. එම ගොඩනැගිල්ල නවීකරණය සඳහා රු.600 000ක් දරණ ලද අතර පැරණි ගොඩනැගිලි කොටස් ඉවත් කිරීම තුලින් රු100 000 ක් ලැබුණි. මෙම ගොඩනැගිල්ලේ ජීව කාලය වසර 20ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.ගොඩනැගිල්ලේ සුන්බුන් අගයක් නොමැති බවට උපකල්පනය කරන්න.

20. ඉහත තොරතුරු පදනම් කර ගනිමින් 2018/03/01 දිනට වත්කමේ පිරිවැය සහ 2018/03/31 දිනට ක්ෂය වශයෙන් හදුනා ගත යුතු වටිනාකම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1) රු. 2400 000 සහ රු. 12 000 කි. 2) රු. 2500 000 සහ රු. 11 500 කි. 3) රු. 2600 000 සහ රු. 13 000කි.

4) රු. 2400 000 සහ රු. 10 000 කි. 5) රු. 1800 000 සහ රු. 7 500කි. (...............)

21. 2018/03/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු ගොඩනැගිලි වටිනාකම,

1) රු.2587,000කි. 2) රු. 1890,500කි. 3) රු.2390,000කි.

4) රු. 2375,000කි. 5) රු.2160,000කි. (...............)

22. සී/ස කඳුරට වැවිලි සමාගමේ 2018/03/31 කෙටුම්පත් ලාභය රු. 1820,000කි. මෙම ලාභය ගණනය කිරීමේ දී පහත අයිතම සැලකිල්ලට ගෙන නොතිබුණි.

- වාහන විකිණීමේ අලාභය රු.120,000කි.
- රක්ෂණ ගාස්තු රු. 60000 ඉදිරි වර්ෂයට අදාල වේ.
- බොල්ණය කපා හැරීම(ලැබිය යුතුදැ සඳහා සංචිතකරණය) රු. 30,000කි.
- සටහන් නොවූ අවසන් අමුද්‍රව්‍ය තොගය රු. 100,000කි.

ඉහත කරුණු සැලකීමෙන් පසු සංශෝධිත ලාභය කොපමණද?

1) රු. 1890,000කි. 2) රු.1930,000කි. 3) රු.1990,000කි.

4) රු. 1970,000කි. 5) රු. 1830,000කි. (...............)

23. පහත දැක්වෙනුයේ නිශ්පාදන ආයතනයකට සම්බන්ධ පිරිවැය අයිතම කිහිපයකි.

A. සෘජු නිශ්පාදන පිරිවැය

B. නිශ්පාදන පොදු කාර්යය පිරිවැය.

C. විකුණුම් හා බෙදාහැරීමේ පිරිවැය.

D. භාණ්ඩ ගෙනයාමේ පිරිවැය.

මෙම අයිතම අතුරින් නිශ්පාදන පිරිවැය ලේඛනය හා සම්බන්ධව හදුනා ගත යුතු පිරිවැය දැක්වෙන පිළිතුර කුමක්ද?

1) A හා D පමණි. 2) A හා C පමණි. 3) A හා B පමණි.

4) D හා C පමණි. 5) C හා D පමණි. (...............)

24. සී/ස ලලිත සමාගමේ 2018/03/31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

ආදායම් බදු ගෙවීම - 2016/17 - 300,000

2017/18 - 900,000

ආදායම් බදු වෙන්කිරීම -2016/17 - 280,000

2017/18 වර්ෂයේ අවසන් හාර්තුවේ බදු වශයෙන් රු.480,000ක් නම් 2017/18 වර්ෂයේ ආදායම් බදු වියදම කීයද?

1) රු.1480,000කි. 2) රු.1200,000කි. 3) රු.1180,000කි. 4) රු. 1380,000කි. 5) රු.1680,000කි.

(..............)

25. සී/ස සමාගමක ගිණුම් වර්ෂය 2018/03/31 න් අවසන් විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018/05/15 දින ඒවා අනුමත කරන ලද අතර 2018/06/30 දින වාර්ෂික මහා සභාව කැඳවන ලදි. 2018/03/31 දිනෙන් පසුව පහත සිදුවීම් ඇති විය.

A. 2018/03/31 දින සිටි රු.360 000/- ණයගැතියකු 2018/04/20 දින බුන්වත් වී ඇත.

B. 2018/03/31 දිනට පැවති රු. 480 000 තොගයක් 2018/04/09 දින රු. 450 000ක් විකුණන ලදි.

C. 2018/03/31 දිනට සිටි රු. 260 000ක් /- ණයගැතියකු 2018/07/01 දින බුන්වත් විය.

D. 2018/03/31 දිනට පැවති රු. 500 000 ආයෝජන වටිනාකම 2018/06/30 දිනට රු. 600 000ක් වී තිබුණි.

E.

ඉහත කුමන සිද්ධීන් 2018/03/31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා වල ගැලපීම් කල යුතුද?

1) A හා C පමණි. 2) A හා B පමණි 3) A හා D පමණි.

4) A , B හා C පමණි. 5) B , C හා D පමණි.

(..............)

ප්‍රශ්න අංක 26, 27,28 සඳහා පහත තොරතුරු පදනම් කර ගන්න.

❖ "වර්ධන" ව්‍යාපාරය නිෂ්පාදන කටයුතු වල නියුක්ත සමාගමකි. 2018/03/31 අවසන් වර්ෂය තුළදී පහත සඳහන් නිෂ්පාදන වී සඳම් දරා ඇත.

සෘජු අමුද්‍රව්‍ය	රු. 1800 000
වෙනත් සෘජු වියදම්	රු. 200 000
ප්‍රාථමික පිරිවැය	රු.2800 000
නිෂ්පාදන පොදු කාර්ය	රු. 800 000

26. ඉහත තොරතුරු පදනම් කර ගනිමින් මෙම ව්‍යාපාරයේ සෘජු ශ්‍රම පිරිවැය ලෙස හඳුනා ගත යුතු වටිනාකම කීයද?

1) රු.1000,000 2) රු.600,000කි. 3) රු. 1400,000කි.

4) රු.800,000කි. 5) රු.1200,000කි. (..............)

27. ඉහත ව්‍යාපාරය විසින් අදාල වර්ෂය තුළ ඒකක 100,000ක් නිෂ්පාදනය කර තිබේ නම්, එම එක් ඒකකයක නිෂ්පාදන පිරිවැය කීයද?

1) රු. 28කි. 2) රු. 46කි. 3) රු.36කි. 4) රු. 38කි. 5) රු. 40 කි.

(..............)

28. වර්ධන ව්‍යාපාරය පිරිවැය මත 25%ක් ලාභ ප්‍රතිශතයක් සහිතව තම නිශ්පාදන මිල කරයි නම්, නිෂ්පාදන ඒකකයක ලැබුණු කල මිල වන්නේ,

1) රු. 35කි. 2) රු.45කි. 3) රු. 50 කි. 4) රු. 60 කි. 5) රු.48 කි.

(...............)

29. සී/ ස ගයාශාන් ව්‍යාපාරය 2017/04/01 දින මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථයක් මිලට ගනී. එහි සාධාරණ අගය රු. 2700,000කි. එදින ගෙවූ මූලික මුදල රු. 700,000කි. කල්බදු පොලිය 10%කි. ඉතිරි මුදල වර්ෂ 4කින් ගෙවිය යුතුය. 2018/03/31 දිනට කල්බදු පොලිය සහ කල්බදු සම්බන්ධ ජංගම වගකීම කොපමණද? වාර්ෂික කල්බදු වාරිකය රු. 631 000කි.

	කල්බදු පොලිය	ජංගම වගකීම
1	200,000	431,000
2	200,000	475,000
3	270,000	361,000
4	270,000	405,000
5	431,000	631,000

(...............)

30. එඩිසන් පොත් පත්තියක් පවත්වා ගෙනයනා ව්‍යාපාරයකට අදාලව උපුටා ගන්නා ලද තොරතුරු කිහිපයක් පහත දැක්වේ. (රු.000)

	2017/04/01	(රු.000) 2018/03/31
ණය ගැති පාලන ගිණුම	200	240
ණයහිමි පාලන ගිණුම	300	480
ණය ගැතියන්ගෙන් ලද මුදල්	-	3100
දුන් වට්ටම්	-	150
ණය හිමියන්ට ගෙවූ මුදල්	-	2060
ලද වට්ටම්	-	80
බොල්ණය කපාහැරීම	-	200
අත්පිට විකුණුම්	-	510
අත්පිට ගැණුම්	-	300
2018/03/31 තොගය	-	120

2018/03/31 දිනෙන් අවසන් වර්ෂයේ දල ලාභය කොපමණද?

1) රු.1800කි. 2) රු. 1380කි. 3) රු.1170කි. 4) රු.1680කි. 5) රු. 1500කි.

(...............)

31. ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශවයන් විවිධ තීරණගැනීම සඳහා ගිණුම්කරණ තොරතුරු උපයෝගී කරගනී. ඒ අනුව පහත දැක්වෙන තොරතුරු. වැදගත් වන පාර්ශවයන් නම් කරන්න.

	පාර්ශවය
A. ව්‍යාපාරයට බාහිර වගකීම් පියවීමේ අවධානමක් පැවතීම	....
B. ගුණත්වයෙන් යුතු භාණ්ඩ වෙළඳපොලට ලැබීම	....
C. ප්‍රසාද දීමනා ගෙවීමට ආයතනය තීරණය කිරීම	....
D. ඉදිරියේ දී රුපියලේ අගය අවප්‍රමාණය වීම	....

32. පහත ගණුදෙනු වල බලපෑම ධන(+) හෝ ඍණ(-) ලකුණ සහිතව ගිණුම්කරණ සමීකරණ මූලිකාංග වල නිරූපණය කරන්න.

වත්කම් = හිමිකම් + වගකීම්

A. ණයහිමියන්ට ගෙවූ රුපියල් 75,000ක චෙක්පත අගරු වීම. ....

B. පෙර වර්ෂයේ ගෙවීමට තිබූ කඩකාමර කුලී රු. 20000 මෙම වර්ෂයේ ගෙවීම ....

33. ඉහත ගණුදෙනු වාර්තා කරන මූලික සටහන් පොත් හා මූලාශ්‍ර ලේඛන මොනවාද?

ගණුදෙනුව	මූලාශ්‍ර ලේඛනය	මූලික සටහන් පොත
A.		
B.		

34. සෝමදාස තොග වෙළඳාමේ යෙදෙන ව්‍යාපාරිකයෙකි. ගුණදාස එම ව්‍යාපාරයේ ගණුදෙනු කරුවෙකි. දෙදෙනාම VAT සඳහා ලියාපදිංචි වී ඇත. ගුණදාස. විකුණුම් කල මිල රු. 500,000ක තොගයක් සෝමදාසගෙන් මිලදී ගත්තේය. VAT අනුපාතය 15% නම් .

i) ණයහිමි පාලන ගිණුමේ දැක්වෙන වටිනාකම කොපමණද? ....

ii) විකුණුම් ගිණුමේ දැක්වෙන වටිනාකම කොපමණද? ....

iii) එම ගණුදෙනුව ගුණදාසගේ ව්‍යාපාරයේ පොත්වල වාර්තා කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

....

....

....

35. විකාතනගේ සමාගමට අදාළ තොරතුරු කිහිපයක් පහත දක්වා ඇත.

(රු.000) වලින්

වෙළඳ ලැබිය යුතු දෑ	60
අඩමාන ණය වෙන් කිරීම	5

❖ ව්‍යාපාරය විසින් වසර අග වෙළඳ ලැබිය යුතු දෑ මත 10%ක අඩමාණ ණය වෙන් කිරීමට තීරණය කර ඇත. ඒ අනුව,

(i) වර්ෂයට අදාල අඩමාන ණය වෙන්කිරීමේ ප්‍රමාණය කොපමණද? ....

(ii) ඊට අදාල ද්විත්ව සටහන ලියා දක්වන්න. ....

....

36. ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක යෙදෙන පසුමල්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනු කිහිපයක් පහත දක්වා ඇත. එම ගණුදෙනු තුලින් රඳවා ගත් ඉපයීම් අඩුවේ, වැඩිවේ, වෙනස් නොවේ ද යන්න සඳහන් කරන්න.

අඩුවේ / වැඩිවේ / වෙනස් නොවේ

A. රු.50,000ක තොගයක් පරිත්‍යාග කිරීම ....

B. වසර අග තොගයේ ශුද්ධ උපලබ්ධි අගය රු.30000කින් පිරිවැයට වඩා වැඩිවීම. ....

C. වර්ෂය අග අඩි අඩමාණ ණය වෙන්කිරීමක් පැවතීම. ....

D. හිනුම් වර්ෂය තුළ රක්ෂණ ගාස්තු රු. 8,000ක් වැඩියෙන් හිනුම්ගත කර තිබීම ....

37. උදාහිරු ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 200කි. මින් 20 දෙනෙකු යාවජීව සාමාජිකයන්ය. වාර්ෂික සාමාජික මුදල රු. 1,000 කි. යාවජීව සාමාජික මුදල් ගිණුම් ශේෂය 2017/04/01 දිනට රු.200,000 මෙය වසර 10 කින් ආදායම ලෙස හඳුනා ගත යුතුය. 2018/03/31 හිග සාමාජික මුදල රු. 6,000කි.

2018/03/31 අවසන් වර්ෂය සඳහා පහත දෑ ගණනය කරන්න.

i) ලද සාමාජික මුදල රු. ....

ii) වර්ෂයේ සාමාජික මුදල් ආදායම රු. ....

❖ 39,40 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු උපයෝගී කරගන්න.

කසුන්, නදුන් හා සදුන් හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ය. 2018/03/31 දිනට කසුන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට නියමිත ය. හවුල් ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධන ගිණුම් හා ජංගම ගිණුම් ශේෂ පිළිවෙලින් කසුන් 900,000, නදුන් - 600,000 සහ සදුන් - 300,000 කි. ජංගම ගිණුම් ශේෂ පිළිවෙලින් 80.000, 60000, 40,000 කි. එදිනට කීර්තිනාමය රු. 1800,000 කි. ලාභ අලාභ බෙදා ගැනීමේ අනුපාතය, එදිනට පවතින ප්‍රාග්ධන ශේෂ වලට අනුපාතිකව හඳුනා ගත යුතුය."

38. නිර්හිතාමය වාර්තා කිරීමට අදාල ද්විත්ව සටහන් (සංලක්ෂය අවශ්‍ය නොවේ / වටිනාකම් සහිතව දක්වන්න)

....

....

....

39. 2018/03/31 දිනට විසර්ජනය කළහැකි ලාභය රු. 900,000ක් වූයේ නම්, 2018/03/31 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් වල පැවතිය යුතු ශේෂයන් වෙන් වෙන්ව ගණනය කරන්න.

....

....

40. i) විශ්‍රාමයන හවුල් කරුව ගෙවිය යුතු මුදල කොපමණද? ....

ii) එම මුදලින් 50% එදිනම ගෙවා ඇත්නම්, ඔහුට ගෙවිය යුතු ඉතිරි මුදල කොපමණද? ....

41. සමිත් හා සුමිත් යන දෙදෙනා හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබන අතර 2017/04/01 දිනට ඔවුන්ගේ ප්‍රාග්ධන ගිණුම් වල ශේෂ පිළිවෙලින් 3,000 හා 4,000 (රු. 000 වලින්) වේ. ප්‍රාග්ධන ශේෂ මත 5%ක පොලියක් ගෙවයි නම්, එය වාර්තා කිරීමට අදාල ද්විත්ව සටහන වනුයේ

....

....

42. ව්‍යාපාරයක 2018/01/31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු.98,000කි. එදිනට මුදල් පාලන ගිණුමේ ශේෂය එම අගයට වඩා වැඩි අගයක් ගෙන තිබුණි. මුදල් පාලන ගිණුම සහ බැංකු ප්‍රකාශය නිවැරදිව පිළියෙල කර තිබේ නම් ඉහත වෙනසට හේතු විය හැකි කරුණු 2ක් සඳහන් කරන්න.

i) ....

ii) ....

43. පහත දක්වා ඇති ගණුදෙනු වාර්තා කිරීමට / හඳුනා ගැනීමට වඩාත්ම යෝග්‍ය වන ගිණුම්කරණ සංකල්පය ලියා දක්වන්න

ගිණුම්කරණ සංකල්පය

i) විකුණුම් පිරිවැය හා විකුණුම් ආදායම හඳුනා ගැනීම ....

ii) ණයට විකුණුම් වටිනාකම , ණය ගැති පාලන ගිණුමේ වාර්තා කිරීම ....

iii) අවසන් තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩු අගයට හඳුනා ගැනීම ....

iv) මූල්‍ය වාර්තාකරණයේදී ආර්ථිකමය ගණුදෙනු පමණක් හඳුනා ගැනීම ....

44. පහත සඳහන් ප්‍රකාශ කළමණාකරණ ගිණුම්කරණය සම්බන්ධයෙන් සත්‍ය වේද නොවේද යන්න දක්වන්න.

සත්‍ය / අසත්‍ය

A. කළමණාකරණ ගිණුම්කරණය නිරතුරුවම පුරෝකථනය සඳහා තොරතුරු ඉදිරිපත්කරයි. ....

B. කළමණාකරණ ගිණුම්කරණය යටතේ ගිණුම්කරණ ප්‍රකාශ පිළියෙල කරනු ලබයි. ....

C. කළමණාකරණ ගිණුම්කරණය යටතේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් වෙත තොරතුරු සන්නිවේදනය කරයි. ....

D. මූල්‍ය ගිණුම්කරණයට බලපාන නීති රීති, සම්ප්‍රදායන් කළමණාකරණ ගිණුම්කරණයට ද බලපානු ලබයි. ....

45. 2018/03/31 අවසන් වර්ෂය තුළ ව්‍යාපාරයක පහත සඳහන් ගණුදෙනු හා සිදුවීම් ඇති විය.

A. රු. 240,000/- අතිරික්තයක් සහිතව ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීම.
B. සාමාන්‍ය කොටස් හිමියන් සඳහා රු. 100,000ක අතුරු ලාභයක් ගෙවීම.
C. ජංගම වත්කම් මත උපයන ලද පොලිය රු. 80,000කි.
D. පොදු සංචිත භාවිතා කරමින් රු. 800,000 සාමාන්‍ය කොටස් නිකුත් කිරීම.

ඉහත ගණුදෙනු හේතුවෙන් 2018/03/31 අවසන් වර්ෂය සඳහා හිමිකමේ සිදු වූ ශුද්ධ වෙනස කොපමණද?

....

46. පසුගිය දිනවල ඇති වූ ගංවතුර හේතුවෙන් ව්‍යාපාරයේ තිබූ ගිණුම් වාර්තා සියල්ල විනාශයට පත්විය. පසුව කරන ලද සොයා බැලීම් වලදී පහත තොරතුරු අනාවරණය කර ගන්නා ලදී.

- 2017.04.01 තොගය රු.250,000කි.
- වර්ෂය තුළ සිදුකල මුළු ගැණුම් 2250,000 කි.
- වර්ෂය තුළ සිදුකල මුළු විකුණුම් 3600,000 කි.
- ව්‍යාපාරයේ විකුණුම් මත දළ ලාභ ආන්තිකය 20%කි.

(අ) ගංවතුරින් විනාශ වූ තොගයේ වටිනාකම කොපමණද? ....

(ආ) විනාශ වූ තොගයේ වටිනාකමින් 75%ක වන්දියක් ගෙවීමට රක්ෂණ සමාගම එකග වී ඇත්නම් ව්‍යාපාරයට සිදු වී ඇති අලාභය කොපමණද? ....

47. සී/ස ජිප්‍රින් වැලි සමාගමක විසින් 2018/01/01 දින කොටසක් රු. 50 බැගින් වූ සාමාන්‍ය කොටස් 500,000 නිකුත් කරන ලදී. කොටස් 550,000 ක් සඳහා අයදුම්පත් ලද අතර. වැඩිපුර ලද කොටස් මුදල් හරවා යවන ලදී. කොටස් නිකුත් කිරීමේ වියදම රු. 100,000කි.

i) 2018/03/31 දිනට ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුමේ ශේෂය කීයද? ....

ii) එදිනට මුදල් පාලන ගිණුමේ ශේෂය කීය ද? ....

48. 2018/02/28 දිනට ව්‍යාපාරයක ගෙවිය යුතු ETF ගිණුමේ ශේෂය රු.30,000 වශයෙන් පැවතුණි. මෙම ව්‍යාපාරයේ සේවා. සේවක EPF දායකය පිළිවෙලින් 15% ක් හා 10% ක් විය. මූලික වැටුප මත එකතු කර තිබූ දීමනා වටිනාකම රු. 500,000 ක් වූ අතර අතිකාල දීමනා රු. 80,000ක් විය.

මෙම ව්‍යාපාරයේ 2018/02/28න් අවසන් මාසයට අදාල

i)ගෙවිය යුතු EPF ගිණුමේ ශේෂය කීයද? රු. ....

ii) දළ වැටුප කීයද? රු. ....

iii) මූලික වැටුප කීයද? රු. ....

49. පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය නම් "√" ලකුණද, අසත්‍ය නම් "x" ලකුණත් යොදන්න

සත්‍ය / අසත්‍ය

i) ලිඛිත ගිවිසුමක් නොමැති විටක හවුල් ව්‍යාපාර සඳහා 1890 හවුල් ආඥා පනත අදාල කරගත යුතුය. ....

ii) සී/ස සමාගම් සඳහා ගිණුම්කරණය, නීතිමය අවශ්‍යතාවයකි ....

iii) පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන අභ්‍යන්තර පාර්ශවයන් සඳහා පමණක් පිළියෙල කෙරේ. ....

iv) මූල්‍ය ගිණුම්කරණය තුළ භාවිතා කරන තොරතුරු ඓතිහාසික තොරතුරු නොවේ. ....

50. පී/ස සාදර් සමාගම විසින් 2018/01/01 දින රු. 2400,000 මෝටර් රථයක් මිලට ගන්නා ලදි. මෙම මෝටර් රථයේ ඵලදායී ජීව කාලය වසර 5ක් ලෙස හදුනා ගෙන ඇත. සුන්බුන් අගය රු. 400,000කි. 2018/03/31 දිනට හදුනාගත යුතු .

i) මෝටර් රථයේ ක්ෂය කළ හැකි අගය කොපමණද? ....

ii) 2018/03/31 දිනට මෝටර් රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුමේ ශේෂය කීයද? ....

සියලුම හිමිකම් ඇවිරිණි / All Right Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 13 ශ්‍රේණිය.
පළමු වාර පරීක්ෂණය - 2018 - නොවැම්බර්
கல்விப் பொதுத் தராதர (உயர்தரப்) பரீட்சை 2018 நிகை, தரம் 13 முதலாம் தவணைப் பரீட்சை
General Certificate of Education (Adv. Level) Grade 13 First Term Test 2018 November

ගිණුම්කරණය - II
Accounting - II

33 S II

කාලය පැය තුනයි මිනිත්තු දහයයි.
03 hours 10 Minutes

උපදෙස්
- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම අලුත් තවදාසියකින් ආරම්භ කරන්න.
- අදාළ පෙර වැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.

1) සීමාසහිත අරුණළු පොදු සමාගම තොග හා සිල්ලර වෙළඳාමේ නියුතු සමාගමකි. 2018-03-31 දිනට එහි ශේෂ පිරික්සුම පහත දක්වා ඇත.

විස්තර	රු. '000 වලින් ගර	බැර
දේපළ පිරියත හා උපකරණ (ධාරණ අගය)	73500	
ගැනුම්	37350	
ගෙන ඒමේ කුලි	1150	
තීරු ගාස්තු	500	
වෙළඳ ලැබිය යුතු දෑ	26700	
2017-04-01 තොගය	8450	
මුදල් හා මුදල් සමාන ද	1350	
පරිපාලන වියදම්	9300	
බෙදාහැරීමේ වියදම්	10400	
ගෙවූ ආදායම් බදු	1300	
ප්‍රකාශිත සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය		30000
විකුණුම් ආදායම		94000
වෙළඳ ගෙවිය යුතු දෑ		18700
2017-04-01 ප්‍රත්‍යාගණන සංචිත		3000
2017-04-01 රඳවාගත් ඉපයුම්		7100
උපචිත බෙදා හැරීමේ වියදම්		400
10% බැංකු ණය (2017-07-01 ලබාගත්)		15000
2017-03-31 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන		300
කොමිස් ආදායම		800
උපචිත පරිපාලන වියදම්		700
	170000	170000

අතිරේක තොරතුරු ।

2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත සඳහන් ද සඳහා ගැලපීම් කළ යුතුය.

i. 2018-03-31 දිනට භාණ්ඩ තොගවල පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන් පහත පරිදි විය.

	පිරිවැය	ශුද්ධ උපලබ්ධි අගය
X කාණ්ඩය	2700	2800
y කාණ්ඩය	3100	2900
Z කාණ්ඩය	2700	2800

ii. වර්ෂයේ විගණන ගාස්තු වියදම රු.500,000 වන අතර, වර්ෂය සඳහා ගෙවා ඇති විගණන ගාස්තුව රු.600,000කි. ගෙවූ වියදම පරිපාලන වියදම් තුළ ඇතුළත්ව ඇත.

iii. වර්ෂයේ ගෙවූ කොමිස් රු.400.000 පමණක් වියදම් තුළ අන්තර්ගත කර ඇත. වර්ෂය තුළ ගෙවිය යුතු කොමිස් මුදල රු.200,000කි.

iv. ගෙවූ ආදායම් බදු වට්නාකම තුළ පසුගිය වර්ෂයට අදාළව අවසාන කාර්තුවේ ආදායම් බදු වට්නාකම ද ඇතුලත්ය. 2018-03-31න් අවසන් වූ 4 වන කාර්තුව සඳහා ආදායම් බදු වශයෙන් රු.400,000 ගෙවිය යුතු බවට හඳුනාගෙන ඇත.

v. 2017-04-01 දිනට දේපල, පිරියත හා උපකරණ හා ඒවායේ සමුච්චිත ක්ෂය වට්නාකම් පහත පරිදි වේ.

	පිරිවැය	සමුච්චිත ක්ෂය	ධාරණ වට්නාකම්
ඉඩම්	20000	-	20000
ගොඩනැගිලි	30000	3000	27000
මෝටර්රථ (බෙදාහැරීමේ කටයුතු)	25000	7500	17500
ලී බඩු හා සවි කිරීම	15000	6000	9000
	90.000	16.500	73500

2018-01-01 දින බෙදාහැරීමේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා නව ලොරි රථ දෙකක් රු.3000,000 අත්පත් කරගන්නා ලදි. මේ සම්බන්ධ මුදල් ගෙවීම හැර කිසිදු සටහනක් පොත්වල වාර්තා කර නැත. ඉඩම් හැර සියලුම දේපල, පිරියත හා උපකරණ ක්ෂය කළ යුතුය. ක්ෂය ප්‍රතිශතය පිරිවැය මත 10%කි.

vi. වර්ෂය තුළ රුපියල් 400,000 සාමාන්‍ය කොටස් නිකුත් කිරීමක් සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් ලද මුළු මුදලම විකුණුම් ගිණුමට බැර කර ඇත.

vii. බැංකු ණය සඳහා පොලිය උපචිතව ඇත.

viii. රඳවාගත් ඉපයුම් භාවිතා කරමින් රු1500,000 ප්‍රසාද කොටස් නිකුතුවක් සිදු කර ඇත.

ix. 2018-03-31 දිනට රඳවාගත් ලාභ උපයෝගී කර ගනිමින් රු.1000,000 පොදු සංචිතයක් ඇති කිරීමට තීරණය කරන ලදි.

අවශ්‍ය වන්නේ,

LKAS-01 ප්‍රමිතියට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සි/ස අරුනළු පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන්ද සහිතව)

i) 2018-03-31 අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.

ii) 2018-03-31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

iii) 2018-03-31 අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය (ලකුණු 20)

2) ඇ) යසිරු හා ඉසුරු ව්‍යාපාරික උපදෙස් සැපයීම ප්‍රධාන කටයුත්ත කර ගත් "Business consulting" ව්‍යාපාරයේ හවුල්කරුවන් ය. 2017-04-01 දින මෙම ව්‍යාපාරයට රුසිරු නව හවුල්කරුවකු ලෙස ඇතුළත් විය. ඔහු යෙදවූ ප්‍රාග්ධනය මුදලින් රු.500,000, මෝටර් රථය රු.300,000කි. පහත සඳහන් එකඟතා හවුල්කරුවන් අතර ඇති කරගෙන ඇත.

- ප්‍රාග්ධන ගිණුම් වල ආරම්භක ශේෂය මත 10%ක පොළියක් ගෙවීම (කීර්තිනාමය වාර්තා කිරීමෙන් පසු ශේෂය මත)
- නව ලාභය අලාභ බෙදා ගැනීමේ අනුපාතය 2:2:1 කි. නව හවුල්කරු බැඳීමට පෙර එය 5:3 විය.
- සියළු හවුල්කරුවන්ට රු.10,000ක මාසික වේතනයක් ගෙවීම

වර්ෂයට අදාල අනිකුත් තොරතුරු

1. 2017-04-01 හිඟ සේවා ආදායම් රු.600,000/-කි.
   වර්ෂයේ සේවා ආදායම ලැබීම් රු.3480,000/- කි.
   2018-03-31 හිඟ සේවා ආදායම රු.800,000/- කි
2. ලිපි ද්‍රව්‍ය මිලට ගත්තා රු.420,000/- මින් රු.20,000/-ක් ලිපි ද්‍රව්‍ය වර්ෂය අග ඉතිරිවිය.
3. දේපල, පිරියත හා උපකරණ වාර්ෂික ක්ෂය රු.200,000/-
4. අනෙකුත් පරිපාලන වියදම් රු.380,000/- මූල්‍ය වියදම් රු. 200,000කි.
5. 2017-04-01 දිනට කීර්තිනාමය 600,000/- ලෙස තක්සේරු කර ඇත. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් තුළ ගැලපිය යුතු අතර, කීර්තිනාම ගිණුමක් පොත් වල පවත්වා නොගනී.
6. 2017-04-01 දින හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ශේෂය පහත දැක්වේ.

	යසිරු	ඉසුරු
ප්‍රාග්ධන ගිණුම	1365,000	1515,000
ජංගම ගිණුම්	400,000	200,000

7. ප්‍රචාරණ හා ප්‍රවර්ධන වියදම් රු. 180,000/- ගෙවා ඇති අතර මින් රු. 30,000 ඉදිරි වර්ෂයට (2018/19) අදාළ වේ.
8. හවුල් කරුවන්ගේ ගැනිලි පිළිවෙලින් යසිරු රු. 80,000, ඉසුරු රු. 60,000 , රුසිරු රු.40,000

අවශ්‍ය වන්නේ

(i) යසිරු, ඉසුරු හා රුසිරු හවුල් ව්‍යාපාරයේ 2018-03-31 දිනෙන් අවසන් වර්ෂයට අදාල ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ගේ විසර්ජනයන් සහිතව)

(ii) නව හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම්

(ලකුණු 10)

ආ) පහත දක්වා ඇත්තේ කුඩා ළමුන්ගේ ඇඳුම් නිෂ්පාදනය කරන "බේබි වෝයිස්" ව්‍යාපාරයට අදාළ තොරතුරු කිහිපයකි.

	රු.
2017-04-01 ආරම්භක අමුද්‍රව්‍ය තොගය	180,000
නොනිමි තොගය	90,000
නිමි තොගය	240,000
අත්පිට ගැනුම් - අමුද්‍රව්‍ය	720,000
නිමි ද්‍රව්‍ය	380,000
අත්පිට විකුණුම්	2850,000
සෘජු වැටුප්	300,000
සුපරීක්ෂක වේතනා	240,000
පරිපාලන වියදම්	120,000
බෙදාහැරීමේ වියදම්	150,000
ගෙනයාමේ කුලී	27,000
අනෙකුත් නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය	240,000
මෝස්තර නිර්මාණ ශිල්පියාට ගෙවීම්	80,000
යන්ත්‍ර ක්ෂය	100,000
වක්‍ර නිෂ්පාදන වියදම්	50,000
මූල්‍ය වියදම්	40,000
2018-03-31 අවසන් තොග - අමුද්‍රව්‍ය	120,000
නොනිමි ද්‍රව්‍ය	80,000
නිමි ද්‍රව්‍ය	420,000

අවශ්‍ය වන්නේ : 2018-03-31 අවසන් වර්ෂය සඳහා

(i) නිෂ්පාදන පිරිවැය ලේඛනය

(ii) නිෂ්පාදන ඒකක 18,000ක් නිෂ්පාදනය කළේ නම්, ඒකකයක නිෂ්පාදන පිරිවැය සහ පිරිවැයට 25% ලාභ ආන්තිකයක් සහිත ව භාණ්ඩ විකුණුම් මිල තීරණය කරයි නම් ඒකකයක විකුණුම් මිල ගණනය කිරීම.

(iii) 2018-03-31 අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය හෝ අලාභය දක්වන ප්‍රකාශනයක්

(ලකුණු 10)

3) පරිගණක උපාංග අලෙවිකිරීමේ වෙළඳසැලක් පවත්වාගෙන මිහාරගේ ව්‍යාපාරය 2018 මාර්තු මස සිදු වූ ගනුදෙනු පහත දී ඇත.

දිනය	ගනුදෙනුව
2018-03-02	රු.500 000 වටිනා පරිගණක තොගයක් අත්පිට මුදලට මිලදී ගන්නා ලදී.
2018-03-04	රු.600 000 වටිනා පරිගණක උපාංග තොගයක් ජනිත් සමාගමෙන් ණයට මිලදී ගත්තා
2018-03-07	රු. 300 000 වටිනා පරිගණක රු.280. 000 ට විසල්ට ණයට විකුණුවා
2018-03-10	රු.400 000 වටිනා තොගයක් රු.450 000 අත්පිට විකුණුවා.

2018-03-12 රු.200 000 තොගයක් රු.220 000 කුළුල්ට ණයට විකුණුවා

2018-03-15 ජනිත්ට ගෙවිය යුතු මුදලින් අවක් 10%ක මුදල් වට්ටමකට යටත් ව පියවන ලදී.

2018-03-17 රු.10,000ක මුදල් වට්ටමකට යටත්ව විසල්ගෙන් මුදල් ලැබුනා වට්ටම .

2018-03-20 මිගාර තම පුතුට පරිහරණය සඳහා රු.60 000ක පරිගණකයක් ත්‍යාග කරන ලදී.

2018-03-24 2017 ගිවිසගත් කඩකාමර කුලිය රු.120 000ක් වුවත් 2018 වර්ෂයට අදාල කඩකාමර කුලිය රු.180 000 විය

කාලච්ඡේදය තුළ ගෙවන ලද කඩකාමර කුලිය 130,000කි.

2018-03-26 මෛවරස් පැතිරීම නිසා හානි වූ පරිගණක වල වටිනාකම රු.200,000 වූ අතර රක්ෂණ වන්දි ලෙස රු.150,000ක මුදලක් ලැබුණි

2018-03-30 පෙර වර්ෂයේ රක්ෂණ වාරිකය වූ රු.50,000 මෙම වර්ෂය තුළ ගෙවා පියවන ලදී.

2018-03-01 දිනට පහත ශේෂ පැවතිය.

දිනය		ආයෝජන	තොග	වෙළඳ ලැබිය යුතු ද	මුදල්	වෙනත් ගෙවිය යුතු දෑ	වෙළඳ ගෙවිය යුතු දෑ	ප්‍රාග්ධනය	රඳවාගත් ඉපයීම
2018-03-01	300	200	325	130	600	280	275	1000	

අවශ්‍ය වන්නේ ,

(අ) මාර්තු 01 වන දා සිට 30 වන දා දක්වා ගනුදෙනු ඉහත ආකෘතිය භාවිතා කරමින් ගිණුම් සමීකරණයේ අගයන් සහිතව වැඩි වේ නම් (+) ද අඩු වේ නම් (-) ද ලෙස දක්වන්න.

(ආ) ශුද්ධ වත්කම් ඇසුරෙන් මාර්තු මස තුල උපයන ලද ශුද්ධ ලාභය ගණනය කරන්න.

(ලකුණු 15)

4) අ) ධූමපෙත්තු සහ පුතුයෝ ගොඩනැගිලි ඉදිකිරීමේ ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන අතර එම ව්‍යාපාරයේ ගනුදෙනු කිහිපයක් පහත දක්වා ඇත. මුදල් පාලන ගිණුමේ ආරම්භක ශේෂය රු. 680,000කි.

<u>ණයට ගැනුම් පිලිබඳ තොරතුරු</u>

		රුපියල්
17.10.01	විකානගේ සමාගමෙන් ද්‍රව්‍ය ගැනුම්	400 000
17.10.02	පිරිවිතර වලට නොගැලපීම නිසා හරවා යැවුම්	70 000
17.10.10	10% වට්ටමකට යටත්ව මුදල් ගෙව්වා	297 000
17.10.12	පුදාර ව්‍යාපාරිකයන්ගෙන් ද්‍රව්‍ය ගැනුම්	500 000
17.10.15	5% වට්ටමකට යටත්ව මුදල් ගෙව්වා	475 000

17.10.18	මහානාම සහෝදරයන්ගෙන් ද්‍රව්‍ය ගැනුම්	750 000
	වෙළඳ වට්ටම	50 000
17.10.22	10% වට්ටමකට යටත්ව මුදල් ගෙව්වා	630 000

විකුණුම් පිළිබඳ විස්තර

17.10.04	අත්පිට විකුණුම්	200 000
17.10.06	පෙරේරා මහතාට ණයට විකුණුම්	430 000
	වෙළඳ වට්ටම	30 000
17.10.10	10% වට්ටමකට යටත්ව මුදල් ලැබුනා	360 000
17.10.12	පමින්ත මහතාට විකුණුම්	360 000
	වෙළඳ වට්ටම	10 000
17.10.17	10% වට්ටමකට යටත්ව මුදල් ලැබුණා	315 000

වෙනත් ගෙවීම්

17.10.22	වැටුප් ගෙව්වා	50 000
17.10.23	ප්‍රවාහන වියදම්	15 000
17.10.24	දුරකථන ගාස්තු	5 000

අවශ්‍ය වන්නේ, 17.10.31 අවසන් මාසය සඳහා

1) ගැනුම් ජර්නලය

2) මුදල් ගෙවීම් ජර්නලය

3) මුදල් පාලන ගිණුම

(ලකුණු 10)

(ආ) පටබැඳිගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසය තුළ සිදු වූ ගණුදෙනු වල සාරාංශයක් පහත දී ඇත.

දිනය	විස්තරය	චෙක්පත් අංකය	වට්ටම	ලැබීම්	ගෙවීම්
01/02	වෙල්ගම සහෝදරයෝ	9612	20		280
01/04	පෙරේරා	361	10	190	
01/07	අත්පිට විකුණුම්	932		320	
01/08	සමාධි වෙළෙන්දෝ	428		200	
01/14	විදුලි ගාස්තු	9613			40
01/18	මෝටර් රථ අලුත්වැඩියා	9614			80
01/20	සිත්රෝ සමාගම	634	25	400	
01/26	ගොඩනැගිලි කුලී	9615			50
01/28	වැටුප් ගෙවීම්	9616			75
01/29	අත්පිට විකුණුම	263		250	
01/30	අත්පිට ගැණුම්	9617			300

පටබැඳිගේ ව්‍යාපාරයට 2018 ජනවාරි මාසය සඳහා ලැබූ බැංකු ප්‍රකාශය පහතින් දක්වා ඇත.

දිනය	විස්තරය	හර	බැර	ශේෂය
17/01/01	ශේෂය			536
01/02	චෙක්පත් 9612	280		256
01/04	චෙක්පත් 361		190	446
01/07	චෙක්පත් 932		320	766
01/08	චෙක්පත් 9613	40		726
01/14	චෙක්පත් 9615	50		676
01/18	චෙක්පත් 9616	75		601
01/20	බැංකු ගාස්තු	5		596
01/26	ස්ථාවර නියෝග	50		546
01/28	සෘජු ප්‍රේෂණ		100	646
2018/10/31 ප/ගෙ/ශේෂය				646

අවශ්‍ය වන්නේ,

i) පටබැඳිගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි මාසය සඳහා සංශෝධිත මුදල් පාලන ගිණුම.

ii) ජනවාරි 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය. (බැංකු ප්‍රකාශයේ ශේෂය මත පදනම්ව)

iii) පටබැඳිගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි 31 දිනට මුදල් පාලන ගිණුම සංශෝධනයට පෙර ශේෂය කොපමණ ද? (ලකුණු 05)

5) අ) පී/ස මහවැලි සමාගම , අපනයනය සඳහා විද්‍යුත් උපකරණ නිෂ්පාදනය කරනු ලබන සමාගමකි. එම සමාගමේ"B" දෙපාර්තමේන්තුව තුල සේවකයින් <u>10 දෙනෙකු</u> සහ වැඩ සුපරීක්ෂකවරයෙකු සේවය කරනු ලබයි. 2018/09/30 න් අවසන් මාසයට අදාල පහත තොරතුරු ඔබ වෙත සපයා ඇත

- සේවකයකුගේ දිනක සේවා කාලය පැය 08 කි.
- පැයකට ගෙවන වැටුප රු.300 කි.
- අතිකාල පැයත් සඳහා , සාමාන්‍ය පැයක වැටුප මෙන් එක හමාරක් සේවකයෙකුට ගෙවනු ලබයි.
- මසකට වැඩකරන සාමාන්‍යය දින ගණන 25කි.
- සෑම සේවකයෙකුම පැය 20 අතිකාල සේවාවක නිරත වී ඇත.
- සුපරීක්ෂකගේ මාසික දළ වැටුප රු.100,000 වන අතර මින් 20%ක් දීමනා වශයෙන් උපයාගෙන ඇත. සියළුම දෙනා සැප්තැම්බර් මස සේවය සඳහා වාර්තා කර ඇතැයි උපකල්පනය කරමින්, 2018 සැප්තැම්බර් මාසය සඳහා, මෙම ව්‍යාපාරයේ,

i) වැටුප් හා වේතන පාලන ගිණුම.

ii) ගෙවිය යුතු EPF ගිණුම.

iii) ගෙවිය යුතු ETF ගිණුම පිළියෙල කරන්න.

(EPF සඳහා සේව්‍ය/සේවක දායකය මූලික වැටුප මත පිලිවෙලින් 15% සහ 10% විය යුතුය. ETF දායකය 3% කි.) (ලකුණු 05)

(ආ) 'දිනුජය' ගොඩවත සමාජය ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන්ගේ සුභසාධනය සහ ස්වයංරැකියා සඳහා තරුණ . තරුණියන් දිරිගැන්වීම පෙරටු කරගනිමින් පිහිටුවා ගත් සංවිධානයකි. 2010/04/01 සාමාජිකයින් 20 දෙනෙකුගෙන් ආරම්භ කල මෙම සංගමයේ වර්තමාන සාමාජික සංඛ්‍යාව 120 කි. මින් 20 දෙනෙකු යාවජීව සාමාජිකයන්ය. 2017/04/01 දිනට සංගමයේ පැවති වත්කම් හා වගකීම් පහත පරිදි විය.

	(රු.'000 වලින්)
දේපල පිරියත හා උපකරණ (ධාරණ අගය)	2400
ස්ථාවර තැන්පතු ගිණුම	800
ලිපිද්‍රව්‍ය තොගය	80
හිඟ සාමාජික මුදල්	60
කලින් ගෙවූ විදුලි ගාස්තු	5
මුදල් ශේෂය	155
යාවජීව සාමාජික මුදල්	100
කලින් ලද සාමාජික මුදල්	90
උපචිත දුරකථන ගාස්තු	60

2018/03/31 න් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දක්වා ඇත. (රු.'000 වලින්)

ආ/ගෙ/ශේ	155	පුහුණු උපකරණ මිලට ගැනීම	1600
දේපල කුලියට දීමෙන් ලද ආදායම	840	වැටුප් — කළමණාකරු	275
		පුහුණුකරුවන්	400
සාමාජිකමුදල්	1110	කාර්යාල වියදම්	340
පුහුණු උපකරණ සඳහා පරිත්‍යාග	500	උපකරණ නඩත්තු වියදම්	60
පැරණි පත්තර අලෙවිය	50	වැඩමුළු සඳහා වියදම්	400
වැඩමුළු සංවිධාන ලැබීම්	600	සංග්‍රහ වියදම්	120
		ප්‍රවාහන වියදම්	30
		ශේෂය ඉ/ගෙ	30
	3255		3255
ආ/ගෙ/ශේෂය	30		

අතිරේක තොරතුරු.

I. ලද පරිත්‍යාග සහ තවත් රු. 1000,000 ක් වැය කර 2018/09/30 දින පුහුණු උපකරණ කට්ටල 100 ක් මිලට ගෙන ඇත.

II. දේපල පිරියත හා උපකරණ මිලට ගෙන ඇත්තේ 2014 අප්‍රේල් 01 දින රු. 4800,000 ක මුදලට වන අතර වාර්ෂික ක්ෂය ප්‍රතිශතය පිරිවැය මත 12.5%කි.

III. යාවජීව සාමාජික අරමුදලින් රු.50,000ක් වාර්ෂික ආදායම් ලෙස හඳුනා ගත යුතුය.

IV. වැඩමුළු සංවිධානය සඳහා ලද මුදලින් රු. 100,000 ක් ඉදිරි වර්ෂයට අදාල වේ.

V. කාර්යාල වියදම් තුළ ලිපිද්‍රව්‍ය සඳහා දරණ ලද රුපියල් 40,000 ක මුදලක් ද විදුලි ගාස්තු වශයෙන් දරණ ලද රු.85000ක මුදලක් ද , දුරකථන ගාස්තු වශයෙන් ගෙවන ලද රු.120,000ක් ඇතුලත් වේ. වර්ෂය අවසානයේ උපචිත වියදම් හෝ කලින් ගෙවූ වියදම් කිසිවක් නොවීය.

අවශ්‍ය වන්නේ,

i) 2018/03/31 දිනට සමුච්චිත අරමුදල.

ii) 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය.

(ලකුණු 10)

6) අ) සෘෂිකර්මික කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ ආනයනය කිරීම සඳහා 2018-04-01 දින ප්‍රසින් විසින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. 2017/04/01 දින ව්‍යාපාරයේ පැවති වත්කම් හා වගකීම් පහත දක්වේ. (රු. 000 වලින්.)

2017/04/01 තොගය	3000
ණය ගැතියෝ	1100
ණය හිමියෝ	1600
රථ වාහන (ධාරණ අගයට)	2700
ගොඩනැගිලි (පිරිවැයට)	1400
ලී බඩු/ කාර්යාල උපකරණ (පිරිවැයට)	800
ප්‍රාග්ධන ගිණුම්	4700
10% බැංකු ණය (2017/04/01 ලබා ගත්)	3000
මුදල් ශේෂය	300

2018/03/31 න් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනු වල සාරාංශයක් පහත දැක්වේ. (රු. 000 වලින්.)

ණයගැතියන්ගෙන් මුදල් ලැබීම්	10200
ණය හිමියන්ට මුදල් ගෙවීම්	7100
දුන් වට්ටම්	100
ලද වට්ටම්	200
කපාහල බොල් ණය	180
ලද කොමිස්	220
පරිපාලන වියදම්	780
බෙදාහැරීමේ වියදම්	620
ගෙවූ පොළිය	180
වෙනත් වියදම්	70

අතිරේක තොරතුරු

1. 2018-3-31 දිනට තොග වටිනාකම රු.2700,000/-

2. 2018-03-31 දිනට ණයගැති ශේෂය රු. 620,000 වූ අතර ණයහිමි ශේෂය රු. 300,000 කි. පියලුම ගැනුම් හා විකුණුම් ණය පදනම මත සිදුකර ඇත.

3. පරිපාලන වියදම් වල විදුලි අත්තිකාරම් රු.80000ක් ද ඇතුලත්ව ඇත. උපචිත රක්ෂණ ගාස්තු රු.30 000කි.

4. රථවාහන වල ගැනුම් මිල රු.3000,000කි. සුන්බුන් අගයක් නොමැති අතර ඵලදායි ජීව කාලය වසර 10 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. අමහතුත් වත්කම් පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතු යි

අවශ්‍ය වන්නේ ,

2018.03.31 අවසන් වර්ෂය සඳහා

i) මුදල් පාලන ගිනුම

ii) ණයගැති පාලන ගිණුම් හා ණය හිමි පාලන ගිණු

iii) කාලච්ඡේදයේ ශුද්ධ ලාභය දැක්වෙන ප්‍රකාශනයක් (ලකුණු 10)

ආ) සීමාසහිත නිල්වලා සමාගම 2018-04-01 දින සංස්ථාපනය කරන ලද අතර එදින එකක් රු.100 බැගින් වූ සමාන්‍ය කොටස් 50000ක් නිකුත් කිරීමට තීරණය කරන ලදී. මේ සඳහා මුදල් ලබා ගැනීමට අදාල අවසාන දිනය වශයෙන් 2018-04-21 දිනය ප්‍රකාශයට පත් කර ඇත. එදින වන විට කොටස් 75000ක් සඳහා අදාල මුදල් ලංකා බැංකුවේ තැන්පත් කර ඇති බවට තහවුරු විය. 2018-04-22 දින රැස් වූ අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් 50000ක් ප්‍රාග්ධනිත කිරීමටත් ඉතිරිය ප්‍රතික්ෂේප කොට මුදල් ගෙවීමටත් තීරණය කරන ලදී. කොටස් නිකුත් කිරීමේ වියදම් ලෙස රුපියල් 50000ක් දරන ලදී.

අවශ්‍ය වන්නේ,

i) ඉහත කොටස් නිකුත් කිරීමට අදාළ ජර්නල් සටහන් (සංලක්ෂය සහිතව)

ii) මුදල් පාලන ගිනුම

iii) ප්‍රකාශිත ප්‍රාග්ධන ගිණුම (ලකුණු 05)

7) ආ) වෙල්ගම සහෝදරයෝ වෙළඳ ව්‍යාපාරයේ 2018 මැයි මාසය තුළ සිදු වූ ණයට ගැණුම් හා ණයට විකුණුම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

සැපයුම්කරු	ණයට ගැණුම්	ආපලු යැවුම්	ගෙවූ මුදල්	ලද වට්ටම්	2018/05/01 ශේෂය
අජන	1870	120	1000	100	400
ප්‍රේමරත්න	1250	250	500	50	150
නාදන්	750	50	600	60	200

ගැණුම්කරු	ණයට විකුණුම	ආපසු පැවුම	මුදල් ලැබීම	දුන් වට්ටම	2018/05/01 ශේෂය
වික්‍රමරත්න	2300	300	1500	150	400
ප්‍රේමරත්න	1900	100	1000	100	200
සෝමරත්න	1500	200	900	90	300

අතිරේක තොරතුරු.

i) ප්‍රේමරත්නට ගෙවීමට තිබූ මුදල ඔහුගෙන් ලැබීමට තිබූ මුදලට හිලව්කරන ලදි.

ii) නාදන්ට නිකුත් කල චෙක්පත අගරු වී ඇති බව බැංකුවෙන් දැනුම් දී ඇත.

iii) සෝමරත්නගෙන් ලද රු.500 චෙක්පත අගරු වී ඇති බව බැංකුවෙන් දැනුම් දී ඇත.

අවශ්‍ය වන්නේ

2018/05/31 දිනට ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම.

(ලකුණු 05)

ආ) විකසිත සමාගමේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 24,000ක ලාභයක් වාර්තා වී ඇත. නමුත් ගිණුම් පරීක්ෂාවේදී පහත වැරදි අනාවරණය කර ගන්නා ලදි.

1. රු.7,000 ක දුරකථන ගාස්තු වියදම් ගෙවීම, මුදල් පාලන ගිණුමේ සටහන් වී තිබුණේ රු.700 ක් ලෙසය.
2. ආපසු එවුම් රු.4,000ක ප්‍රමාණය ආපසු පැවුම ගිණුම හර කර ඇත.
3. රු.500,000 ක යන්ත්‍රයක් මිලදී ගැනීම, යන්ත්‍ර අළුත්වැඩියා ගිණුමට හර කර ඇත. මෙම වත්කමේ පිරිවැයෙන් 10%ක ප්‍රමාණයක් වාර්ෂික ක්ෂය ලෙස කපා හැරිය යුතුය.
4. ණය හිමියෙකුගෙන් ලැබූ රු.20,000 ක වට්ටම, ලද වට්ටම් ගිණුමේ නිවැරදිව සටහන් කලද, ණයහිමි පාලන ගිණුමේ සටහන් වී නොමැත.
5. ණය ගැතියන්ගෙන් කපාහල බොල් ණය රු.800ක් බොල්ණය ගිණුමේ සටහන් වී ඇත්තේ රු. 8,000ක් වශයෙනි.

අවශ්‍ය වන්නේ,

I. 2018 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන්.(සංලක්ෂය අවශ්‍ය වේ.)

II. 2018 මාර්තු 31 දිනට අදාලව හඳුනාගත යුතු නිවැරදි ලාභය හෝ අලාභය දැක්වෙන ප්‍රකාශනයක්. (ලකුණු 10)